# 2022 අප්‍රේල් මස 21 වන දින පැවති නව ආයෝජන,ආදායම් ප්‍රවර්ධන,ඉඩම් හා දේපල නිරවුල් කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව

**කමිටු සාමාජිකයන්**

| | | |
|---|---|---|
| 1. ගරු ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති |
| 2. ගරු රංජිත් රාජකරුණා මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 3. නලින් සිරිවර්ධන මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 4. ගරු නිර්මලි ප්‍රියදර්ශනි මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 5. කේ.ඒ.ඉන්ද්‍රාණි මැතිතුමිය | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 6. ඩී.ජී.පේමදාස මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |

**නොපැමිණීම**

| | | |
|---|---|---|
| 1. ගරු ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති |
| 2. කේ.ඒ.ඉන්ද්‍රාණි මැතිතුමිය | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 3. ඩී.ජී.පේමදාස මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |

**නිලධාරි**

| | | |
|---|---|---|
| 1. ජයනි රාජකරුණා මිය | - | නාගරික ගණකාධිකාරි |
| 2. කේ.ජී.එන්.සී.බණ්ඩාර මහතා | - | නාගරික ඉංජිනේරු |
| 3. එන්.පී.කේ.රණසිංහ මිය | - | පරිපාලන නිලධාරි |
| 4. ඩී.එන්.ප්‍රියන්ති මිය | - | නීති නිලධාරි |
| 5. එරික් පී මදනායක මහතා | - | ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරි |
| 6. එස්.අයි.සිල්වා මිය | - | ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි(පාලන) |
| 7. එම්.ජී.සී.සනත් මහතා | - | ප්‍රධාන ආදායම් පරීක්ෂක |
| 8. ඩී.එම්.අරුණ රන්දෙනිගම මහතා | - | මහජන පොල පාලක |
| 9. ජේ.බී.මධුෂා ගයත්‍රී මෙනවිය | - | විෂය ලිපිකරු |

**නිලධාරි නොපැමිණී**

| | | |
|---|---|---|
| 1. එන්.පී.කේ.රණසිංහ මිය | - | පරිපාලන නිලධාරි |
| 2. ඩී.එන්.ප්‍රියන්ති මිය | - | නීති නිලධාරි |
| 3. ඩී.එම්.අරුණ රන්දෙනිගම මහතා | - | මහජන පොල පාලක |

අද දින කමිටු සභාපති නොපැමිණීම හේතුවෙන් කමිටු සාමාජිකයන් විසින් වැඩබලන සභාපති ලෙස ගරු නාගරික මන්ත්‍රී ගරු රංජිත් රාජකාරුණා මැතිතුමාව යෝජනා කරන ලදි. වැඩබලන සභාපති ලෙස ගරු නාගරික මන්ත්‍රී ගරු රංජිත් රාජකරුණා මැතිතුමා අද දින න්‍යාය පත්‍රය අනුව කමිටුවේ කටයුතු ඉදිරියට පවත්වා ගෙන යන ලදි.

1. උතුරු මැද පළාත් වාණිජ කර්මාන්ත හා කෘෂිකර්ම මණ්ඩලයේ සභාපති, මහින්ද ජයසේන මහතා විසින් ලිපියක් යොමු කරමින් අනුරාධපුර මහ නගර සභාව විසින් මහජන ක්‍රීඩාංගනයට යාබද කැළෑව විනාශ කිරිම සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කරන ලද ලිපියේ පිටපත කමිටුව වෙත යොමු කිරිම.

   දැනටමත් මේ පිළිබඳ තීරණයක් ලබා ගෙන ඇති බැවින් මේ කමිටුවේ දැනිමේ හැටියටත් ලැබුණ තොරතුරු අනුවත් පරිසර හානියක් සිදුවි නොමැති බවට පෙනි ගිය බැවින්, එම කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා කිරිම අවශ්‍ය නැති බව තීරණය විය.

   - සටහන - ගරු නාගරික මන්ත්‍රී නලින් සිරිවර්ධන මැතිතුමා විසින් මහජන ක්‍රීඩාංගනය යාබඳ පරිසර හානියක් සිදුවි නොමැති බවත්, එම ස්ථානයේ ආදායම් උත්පාදන කාර්යක් හා රැකියා උත්පාදන කාර්යක් ලෙස කාන්තා හා ළමා කටයුතු, සමාජ සවිබල ගැන්විම, ජීවනෝපාය සංවර්ධන හා දරිද්‍රතාවය පිටු දැකිම පිළිබඳ ස්ථාවර කමිටුව වෙත ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති වර්තාව අනුව තෝරාගත් ලේඛණය මගින් නාගරික බල ප්‍රදේශයේ ස්වයං රැකියා ලෙස  ස්වභාවික විසිතුරු මල්පැල අලෙවි කිරිමට අවස්ථාවක් ලබාදිමට තීරණය කර ඇති බව පවසන ලදී. (වගකිම - සැලසුම් අංශ ප්‍රධානි)

2. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ, එම්.එච්.බී.පී.මාදන මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් මහ නගර සභා භූමියේ පිහිටි හෙළ බොජුන්හල සඳහා නව ව්‍යවසායිකාවන් බඳවා ගැනිම සම්බන්ධව යොමු කරන ලද ලිපිය.

   මහා නගර සභාව තුල හෙල බොජුන්හල ඉදිරිපිට මහජනතාවට ප්‍රදර්ශනය වන ලෙස නව ව්‍යවසායක සඳහා ඉල්ලිමක් කරන ලෙස  දැන්විම් පුවරුවක් ප්‍රදර්ශනය කිරිමට තීරණය විය. එහිදි ලැබෙන ඉල්ලීම් සුදුසුකම් මණ්ඩලයක් මගින් පරික්ෂා කිරිමෙන් පසු නව ව්‍යවසායකයන් තෝරා ගැනිමට තීරණය විය. (වගකිම -

3. අනුරාධපුර පවිත්‍රපුර මල්වතු ඔය රක්ෂිත සීමාවෙන් මීටර් 40 ට මෙහා පදිංචි වූ අය සඳහා පෙර තිබූ මල්වතු ඔය රක්ෂිත සීමාව මීටර 40 කර මෙම ඉඩම්වලට නීත්‍යානුකූල ඔප්පු ලබා දෙන ලෙස කර ඇති ඉල්ලිම.

   මේ සඳහා මෙම කමිටුවට බලයක් නොමැති බැවින් මේ පිළිබඳ වාරිමාර්ග අධ්‍යක්ෂතුමාට හා අදාල ප්‍රාදේශීය ලේකම්තුමාට දන්වා යවා  තීරණය ගැනිමට මෙම ඉල්ලීම් කරන අයට දන්වා යැවිමට තීරණය විය.

   මෙහිදි ඉතා වැදගත් කරුණු වන්නේ සංවර්ධන කාර්ය මත ඉවත් කිරිමේ කොන්දේසිය මත ලබාදිමට සුදුසු බව නිර්දේශ කිරිම. (වගකිම - නාගරික ඉංජිනේරු)

4. අනුරාධපුර,ගෙවල් 55 පාර,සුභද්‍රපුර,අංක:03,ඩබ්.ඒ.ජේ.සි.ජයවර්ධන මහතා  නගර සභාව මගින් ලබාදී ඇති සුභද්‍රපුර ඉඩම් කට්ටිවල මායිම්  නිවැරදි කර ඔප්පු ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.

   ප්‍රාදේශීය ලේකම්තුමාට මේ පිළිබඳ දන්වා එම කටයුතු කඩිනම් කර ගැනිම සඳහා පියවර ගතයුතු බව අදාල ඉල්ලීම් කරන අයට දන්වා යැවිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

5. කමිටු සභාපති නීතිඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ලිපියක් යොමු කරමින් යාපනය හන්දිය ප්‍රදේශයේ 318,319 හා 250 දරණ ග්‍රාමසේවා වසම්වල පිහිටි යාපනය හන්දිය අසල වෙළඳ සංකීර්ණ 03 හා ඒ ආශ්‍රිත බිම්කඩවල සම්පූර්ණ මැනුම් වාර්තාවක් ලබා ගෙන එහි නව සංවර්ධන සැළසුම් සකස් කර ඉදිරිපත් කරන ලෙස කර ඇති ඉල්ලීම.
අදාල ඉඩම් කොටස් මැනිම සඳහා අවශ්‍ය පියවර ගැනිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

6. කමිටු සභාපති නීතිඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ලිපියක් යොමු කරමින් යාපනය හන්දිය ප්‍රදේශයේ ප්‍රයිම් ලැන්ඩ් ඉඩම තුල නගර සභාවට වෙන් කල භූමියේ ඔප්පුව ලබා ගැනිම හා මායිම් සඳහා සලකුණු යොදා ඉඩම ආරක්ෂා කරන ලෙස කර ඇති ඉල්ලීම.
අදාල ඉඩම් කොටස් මැනිම සඳහා අවශ්‍ය පියවර ගැනිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

7. කමිටු සභාපති නීතිඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ලිපියක් යොමු කරමින් ජයන්ති මාවත කඩ 30 ඉදිරිපිට හිස් භූමිය මැනුම් කර සංවර්ධන සැළැස්මක් ඉදිරිපත් කරන ලෙස කර ඇති ඉල්ලීම.
අදාල ඉඩම් කොටස් මැනිම සඳහා අවශ්‍ය පියවර ගැනිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

8. ගරු නාගරික මන්ත්‍රී නලින් සිරිවර්ධන මැතිතුමා විසින් වකුගඩු රෝහල ඉදිරිපිට තබා ඇති කන්ටේනර් පෙට්ටියට අදාලව මහා නගර සභාව සමග ගිවිසුම් ගතවී ඇති සහ ඒ සම්බන්ධ හුවමාරුවී ඇති ලිපි ලේඛණ සම්බන්ධව කරන ලද ඉල්ලීම.

අද දින ප්‍රධාන අදායම් පරික්ෂක විසින් ඊට අදාල සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපති විසින් නිකුත් කල ලිපිය කමිටුවට ඉදිරිපත් කරන ලදි. එම ලිපිය බැලිමේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයේම ඉල්ලිමක් නොවන බවත්, දැනට කන්ටේනර් පෙට්ටිය තබා ඇති පුද්ගලයා විසින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් කරන ලද ඉල්ලිමට ගරු නගරාධිපතිතුමා වෙත එවන ලද ලිපියකි. ඒ අනුව මෙහි කිසිම ආකාරයකට වෙනත් ව්‍යාපාර කටයුත්තක් කිරිමට ඉඩ නොදිමටත් තීරණය විය. තවද මෙම කන්ටේනර් පෙට්ටියේ සිදු කරන ව්‍යාපරය පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් ඊළඟ නව ආයෝජන,ආදායම් ප්‍රවර්ධන,ඉඩම් හා දේපල නිරවුල් කිරිමේ කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස කමිටුව තීරණය කරන ලදි. (වගකිම - නාගරික ගණකාධිකාරි)

<u>මුදල් ස්ථාවර කමිටු නිර්දේශයන් සඳහා</u>

- අනුරාධපුර, හරිස්චන්ද්‍ර මාවත, වකුගඩු රෝහල ඉදිරිපිට කඩ හිමියන් විසින් ලිපියක් යොමු කරමින් වෙළඳ කුටිවල දෛනික බදු මුදල රුපියල් 1000.00 ක් දක්වා වැඩි කර ඇති බවත්,පවතින ආර්ථික අපහසුතා හමුවේ රුපියල් 250.00 ක් දක්වා අඩු කර දෙන ලෙස එම පිරිස විසින් කර ඇති ඉල්ලිම සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනිමට යොමු කිරිම.

**<u>වෙනත්</u>**

- අනුරාධපුර,මෛත්‍රීපාල සේනානායක මාවත,අංක:514/ඒ,VIGILANT GROUP,සභාපති විසින් ලිපියක් ඉදිරිපත් කරමින් මහජන ක්‍රීඩාංගනය පිටුපස බඳු දිමට නියමිත මහා නගර සභාව සතු "සිටි ක්ලබ්" ව්‍යාපෘතිය සඳහා විරෝධය පළ කිරිමේ ලිපිය සාකච්ජා කිරිම සඳහා ජුනි මස කමිටුව වෙත යොමු කරන ලෙස තීරණය කරන ලදී.

නීතිඥ රංජිත් රාජකරුණා,

නාගරික මන්ත්‍රී / කමිටු සභාපති (වැඩ බලන),

නව ආයෝජන,ආදායම් ප්‍රවර්ධන,ඉඩම් හා දේපල නිරවුල් කිරිම පිළිබඳ ස්ථාවර කමිටුව,

මහා නගර සභාව,

අනුරාධපුර.